නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10,

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**12 ශ්‍රේණිය**

# මානුෂ භූගෝල විද්‍යාව

**(ලෝක ජන සංඛ්‍යාවේ ගති ලක්‍ෂණ)**

**ඒකක පරීක්‍ෂණය - 01**

**එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් සුදුසු හෝ පිළිතුර තෝරන්න.**

(1) ලොව ප්‍රධාන ජන සාමූහික හතරෙන් තුනක්ම පිහිටා තිබෙන්නේ,

i. යුරෝපා මහද්වීපයේය.

ii. උතුරු ඇමෙරිකා මහද්වීපයේය

iii. ආසියා මහද්වීපයේය.

iv. අප්‍රිකා මහද්වීපයේය.

v. දකුණු ඇමෙරිකා මහද්වීපයේය.

(2) ජන සංඛ්‍යාව හයනයවීමට ලක්වන්නේ පහත සඳහන් කුමන තත්වයන් යටතේ ද?

i. සාඵල්‍යතාවය පහළ බැසීම හා මර්ත්‍යතාවය ඉහළ නැගීම.

ii. සාඵල්‍යතාවය පහළ බැසීම හා මර්ත්‍යතාවය පහළ බැසීම.

iii. සාඵල්‍යතාවය ඉහළ නැගීම හා මර්ත්‍යතාවය පහළ බැසීම.

iv. සාඵල්‍යතාවය ඉහළ නැගීම හා මර්ත්‍යතාවය ඉහළ නැගීම.

v. සාඵල්‍යතාවය හා මර්ත්‍යතාවය සමාන වීම.

(3) කොංගෝව, ග්‍රීන්ලන්තය, ඕස්ට්‍රේලියාව හා ජපානය යන රටවලට ආවේනික වූ ආදිවාසි ජන කණ්ඩායම් නිවැරදී අනුපිළිවෙලින් සඳහන් වන පිළිතුර කුමක් ද?

i. අයිනුස්වරු, ඇස්කිමෝවරු, ඇබොරිජින්වරු, පිග්මිවරු.

ii. රතු ඉන්දීයන්වරු, ඇස්කිමෝවරු, අයිනුස්වරු, ඇබොරිජින්වරු


iii. පිග්මිවරු, ඇස්කිමෝවරු, ඇබොරිජින්වරු, අයිනුස්වරු

iv. රතු ඉන්දීයන්වරු, අයිනුස්වරු, ඇබොරිජින්වරු, ඇස්කිමෝවරු

v. පිග්මිවරු, ඇස්කිමෝවරු,රතු ඉන්දීයන්වරු, අයිනුස්වරු

(4) 2018 වර්ෂයේදී කිසියම් රටවල් දෙකක් සඳහා වූ සංඛ්‍යා පිරමීඩ දෙකක් මෙහි (අ) සහ (ආ) මගින් දැක්වේ ඒවා අදාළ වන රටවල් දෙක පිළිවෙලින් දැක්වෙන්නේ

| | | |
|---|---|---|
| i. | (අ) ඉන්දියාව | (ආ) සවුදි ආරාබිය |
| ii. | (අ) එක්සත් රාජධානිය | (ආ) කෙන්යාව |
| iii. | (අ) ඇමරිකා එක්සත් ජනපදය | (ආ) ඕස්ට්‍රේලියාව |
| iv. | (අ) චීනය | (ආ) තුර්කිය |
| v. | (අ) එක්සත් රාජධානිය | (ආ) චීනය |




(5) ජන සංක්‍රාන්ති න්‍යායේ අවස්ථා වලට අනුව (A) ඉහල උපත් අනුපාතිකයන් හා (B) සීග්‍රයෙන් පහත වැටෙන මරණ අනුපාතිකයන් දැක්වෙන අවස්ථා නිවැරදි ලෙස හඳුනාගෙන ඇත්තේ පහත කවර පිළිතුරෙන් ද?

| | | |
|---|---|---|
| i. | (A) 1 වැනි අවස්ථාව | (B) 2 වැනි අවස්ථාව |
| ii. | (A) 2 වැනි අවස්ථාව | (B) 3 වැනි අවස්ථාව |
| iii. | (A) 2 වැනි අවස්ථාව | (B) 4 වැනි අවස්ථාව |
| iv. | (A) 3 වැනි අවස්ථාව | (B) 4 වැනි අවස්ථාව |
| v. | (A) 1 වැනි අවස්ථාව | (B) 3 වැනි අවස්ථාව |

(6) පුමිතිරි අනුපාතය නම් කිසියම් ජන සංඛ්‍යාවක

i. ස්ත්‍රීන් 1,000කට පුරුෂයින් සංඛ්‍යාවයි.

ii. පුරුෂයින් 100කට ස්ත්‍රීන් සංඛ්‍යාවයි.

iii. පුරුෂයින් 1,000කට ස්ත්‍රීන් සංඛ්‍යාවයි.

iv. ස්ත්‍රීන් 100කට පුරුෂයින් සංඛ්‍යාවයි.

v. වයස අවුරුදු 15-29 අතර ස්ත්‍රීන් 100කට පුරුෂයින් සංඛ්‍යාවයි.

(7) පහත සඳහන් සංඛ්‍යා අගයන් අතුරෙන් වර්ෂ 2012 දී ශ්‍රී ලංකාවේ ජනවාර්ගික සංයුතියෙහි ප්‍රතිශත දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?

| | සිංහල | ශ්‍රී ලංකා දෙමළ | ඉන්දීය දෙමළ | ශ්‍රී ලංකා මුස්ලිම් | වෙනත් |
|---|---|---|---|---|---|
| i. | 74.9 | 11.2 | 4.1 | 9.3 | 0.5 |
| ii. | 82.0 | 4.3 | 5.1 | 7.9 | 0.7 |
| iii. | 73.9 | 12.4 | 5.5 | 7.1 | 0.8 |
| iv. | 77.2 | 8.5 | 6.1 | 7.2 | 1.0 |
| v. | 81.1 | 6.2 | 5.4 | 5.2 | 2.1 |

(8) ජන සංඛ්‍යාවේ ගති ලක්ෂණ හතර වන්නේ

i. ප්‍රවණතාව, වර්ධනය, විශාලත්වය, සංයුතිය හා ප්‍රමිතිය.

ii. ව්‍යාප්තිය, සංක්‍රමණය, විශාලත්වය හා වර්ධන සීඝ්‍රතාවයය.

iii. ප්‍රවණතාව, විශාලත්වය, වර්ධනය, ව්‍යාප්තිය හා සංයුතිය ය.

iv. විශාලත්වය, සංයුතිය, ප්‍රවණතා හා වර්ධන සීඝ්‍රතාවයය.

v. සංක්‍රමණය, වර්ධන, සීඝ්‍රතාව ප්‍රවණතාව හා සංයුතිය ය.

(9) දෙවන ලෝක යුද්ධයෙන් පසු කාලයේදී සිදුවූ ජනසංඛ්‍යා ස්පෝටනයට හේතුවූයේ

i. සංවර්ධනය වන රටවල් උපත් සීඝ්‍රතාවයේ අඩුවීමක් නොමැතිව සීඝ්‍රයෙන් පහළ ගිය මරණ සීඝ්‍රතාවයයි.

ii. යුද්ධයෙන් විනාශ වූ රටවල් ජනාවාස කිරීමට යුරෝපා රටවල් අනුගමනය කළ පතිපත්තීන්ය.

iii. සංවර්ධනය වන සහ සංවර්ධිත රටවල විශාල වශයෙන් සිදුවූ කාර්මීකරණයයි.

iv. යුද්ධ කාලයේදී උපත් සුළු සංඛ්‍යාවක් සමඟ අධික මරණ සංඛ්‍යාවයි.

v. සංවර්ධනය වන රටවල සිට සංවර්ධිත රටවල් කරා සිදුවූ ජන සංක්‍රමණයයි.

(10) "හැකිලෙන ජනගහන පිරමීඩයේ" ප්‍රධාන ලක්ෂණ තුනක් අඩංගු නිවැරදි පිළිතුර වන්නේ,

i. පහළ ආයු අපේක්ෂාව, ඉහළ උපත් අනුපාතය, පහළ මරණ අනුපාතය

ii. ඉහළ ආයු අපේක්ෂාව, පහළ උපත් අනුපාතය, පහළ මරණ අනුපාතය

iii. ඉහළ ආයු අපේක්ෂාව, පහළ උපත් අනුපාතය, ඉහළ මරණ අනුපාතය

iv. පහළ ආයු අපේක්ෂාව, පහළ උපත් අනුපාතය, පහළ මරණ අනුපාතය

v. ඉහළ ආයු අපේක්ෂාව, ඉහළ උපත් අනුපාතය, ඉහළ මරණ අනුපාතය

(11) පළල් වූ පාදයක් සමඟ ඉහළට යනවිට පළලින් අඩු වී යන වයස් කාණ්ඩයක් සහිත ජන සංඛ්‍යා පිරමීඩයකින් හැඟවෙන්නේ, ජන සංඛ්‍යාව

i. සීඝ්‍රයෙන් අඩුවන බවය.
ii. සෙමෙන් අඩුවන බවය.
iii. සීඝ්‍රයෙන් වැඩිවන බවය.
iv. වර්තමාන මට්ටමෙහි ස්ථාවර වන බවය.
v. ප්‍රශස්ත මට්ටමක් කරා ළඟාවන බවය.

(12) වර්තමාන ලෝකයේ මුළු ජන සංඛ්‍යාවෙන් ආසන්න ලෙස කුමන ප්‍රතිශතයක් සංවර්ධනය වෙමින් පවත්නා රටවල වාසය කරන්නේ ද?

i. 25%
ii. 35%
iii. 40%
iv. 50%
v. 80%

(13) ලෝකයේ ප්‍රධාන ජන සංකේන්ද්‍රණ හතරක් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?

i. නැගෙනහිර ආසියාව, දකුණු අප්‍රිකාව, දකුණු යුරෝපය, ඊසානදිග උතුරු ඇමරිකාව
ii. නැගෙනහිර ආසියාව, දකුණු ආසියාව, වයඹදිග යුරෝපය, දකුණු අප්‍රිකාව
iii. අග්නිදිග ආසියාව, දකුණු අප්‍රිකාව, ඊසානදිග උතුරු ඇමරිකාව, මධ්‍යම ඇමරිකාව
iv. වයඹදිග යුරෝපය, ඇතුරු ඇමරිකාව, නැගෙනහිර ආසියාව, දකුණු ආසියාව
v. නැගෙනහිර ආසියාව, දකුණු ආසියාව, ගිනිකොනදිග ආසියාව, වයඹදිග යුරෝපය

(14) ජනසංඛ්‍යාව වර්ධනයවීමට බලපාන ප්‍රධාන සාධක දෙකක් නම්,

i. උපත් අඩුවීම හා මරණ අඩුවීම
ii. උපත් වැඩිවීම හා මරණ වැඩිවීම
iii. උපත් හා මරණ සමානවීම
iv උපත් අඩුවීම හා මරණ වැඩිවීම
v. උපත් වැඩිවීම හා මරණ අඩුවීම

(15) ජනසංඛ්‍යාවේ ව්‍යුහය හා පුමිතිරි බව නිරූපණය කරනු ලබන ප්‍රස්ථාරයක් වනුයේ.

i. සක් සටහන්
ii. පිරමීඩ ප්‍රස්තාර
iii. සරළ තීරු ප්‍රස්තාර
iv රේඛා ප්‍රස්තාර
v. වෘත්ත ප්‍රස්තාර

(16) පිරමීඩ ප්‍රස්තාරයකින් ජනසංඛ්‍යාව නිරූපනය කිරීමේදී පතුල බර පිරමීඩයකින් හෙළිවන ප්‍රධාන ලක්‍ෂණ දෙකක් නම්.

i. ළමා යැපෙන්නන් අඩුය, වැඩිහිටි යැපෙන්නන් වැඩිය.
ii. ළමා ගැහැණු දරුවන් වැඩිය, පිරිමි දරුවන් අඩුය.
iii. ළමා යැපෙන්නන් වැඩිය, වැඩිහිටි යැපෙන්නන් අඩුය.
iv ශ්‍රම බළකාය ක්‍රමයන් අඩු වේ, යැපෙන්නන් ක්‍රමයෙන් වැඩි වේ.
v. ස්ත්‍රී ජනකාය අඩුය, ශ්‍රමිකයන් ද අඩුය.

(17) A - ජනසංඛ්‍යා වර්ධනයේ ප්‍රධාන අවධි දෙකක් ඇත.
B - මිලියනයකට වඩා අඩුය.
C - ලෝකයේ වැඩිම ජනසංඛ්‍යාවක් ඇති රට ඇමරිකා එක්සත් ජනපදයයි.
D - ක්‍රි.ව. 2025 හා 2030 කාලය වනවිට ලෝක ජනසංඛ්‍යා වර්ධන අනුපාතිකය ස්ථාවර මට්ටමකට පත්විය හැකිය.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් ලෝක ජනසංඛ්‍යාව සම්බන්ධ ප්‍රකාශන අඩංගු පිළිතුර තෝරන්න.

i. A, B හා C
ii. C, B හා D
iii. A, D හා C
iv A, B හා D
v. A, C හා D

(18) ක්‍රි.ව. 2050 වනවිට ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යාවෙහි ඇතිවිය හැකි ප්‍රවණතාවයකි.

i. ළමා ජනසංඛ්‍යාව වැඩිවීම.
ii. ජනසංඛ්‍යාව වයස්ගතවීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබීම.
iii. ජනසංඛ්‍යාවේ වර්ධන වේගය ක්‍රමයෙන් ඉහළ නැගීම.
iv රැකියා සහ අධ්‍යාපන කටයුතු සඳහා විදේශගතවීමේ සංඛ්‍යාව අඩුවීම.
v. ජනසංඛ්‍යාවේ ශ්‍රම බළකාය වැඩිවීම.

**පහත දී ඇති ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(1) කිසියම් රටක ජනසංඛ්‍යාව තීරණයවීමට බලපාන සාධක මොනවා ද?

(2) සංවර්ධිත රටවල උපත් අනුපාතිකය අඩුවීමට හේතු සාධක වූ කරුණු තුනක් පැහැදිලි කරන්න.

(3) වයස්ගත වන ජන සංඛ්‍යාවක් නිසා සංවර්ධනය වෙමින් පවතින රටවල උද්ගතවන ප්‍රධාන ගැටලු තුනක් සාකච්ඡා කරන්න.

(4) ලෝක ආකෘති සිතියමක ලෝකයේ අධික ජන සංඛ්‍යාවක් ව්‍යාප්ත වී ඇති කලාප ලකුණු කොට නම් කරන්න.

(5) ලෝකයේ ජනගහන ව්‍යාප්තියට බලපාන භෞතික සාධක දක්වා උදාහරණ සහිතව විස්තර කරන්න.

(6) මුල් කාලයේ භෞතික සාධක බලපෑමෙන් ජන ශූන්‍ය වූ ප්‍රදේශ අද වනවිට මධ්‍යම ජන සංඛ්‍යාවක් ව්‍යාප්තවීමට බලපා ඇති හේතු උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(7) පසුගිය දශක දෙක තුළදී, ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ හා උතුරුමැද පළාතේ ජන සංඛ්‍යා වර්ධනය හා ඝනත්වය කෙරෙහි දායක වූ ප්‍රධාන සාධක පළාත් දෙකෙන්ම උදාහරණ සපයමින් විස්තර කරන්න.

(8) ශ්‍රී ලංකාවේ නිදහස ලැබූ කාලයේ සිට ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තිය අවම කරගැනීම සඳහා දායක වූ ප්‍රධාන සංචලන රටා දෙක කෙටියෙන් විස්තර කරන්න.

(9) ජන සංක්‍රමණය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් දැයි, කෙටියෙන් දක්වන්න.

(10) වර්තමාන ගෝලීය ජන සංක්‍රමණයේ කැපී පෙනෙන ලක්ෂණ දක්වන්න.


(11) වර්තමානයේදී ගෝලීය ජන සංක්‍රමණයේ ගැටලු සාකච්ඡා කරන්න.

(12) ශ්‍රී ලංකාවේ සමාජ - ආර්ථික සංවර්ධනය කෙරෙහි ශ්‍රම සංක්‍රමණය දායක වන ආකාර පැහැදිලි කරන්න.

(13) ප්‍රධාන ජන සංඛ්‍යා පිරමීඩ වර්ග දෙකක් කටු සටහන් මඟින් ඇඳ ඒවායේ හැඩයේ වෙනස්කම් වලට බලපාන හේතු පැහැදිලි කරන්න.

(14) රටක ජන සංඛ්‍යාවේ වියපත් කාණ්ඩයේ ප්‍රතිශතය වර්ධනය වීමට හේතු වූ සාධක විස්තර කරන්න.

(15) 20 වන සියවසේ ආරම්භයේ සිට ශ්‍රී ලංකාවේ දළ උපත් අනුපාතිකය සහ දළ මරණ අනුපාතිකය හැසිරුණු ආකාරය පහත සඳහන් රූප සටහන මඟින් දක්වේ.




i. මෙම රූප සටහනෙහි 1, 2 සහ 3 යනුවෙන් අනුපිළිවෙලට දක්වා ඇති අදියර තුන මොනවා ද?

ii. ඉහත සටහනට අනුව 20 වන සියවසේ මුල් අවධියේ ශ්‍රී ලංකාවේ පැවති දළ උපත් අනුපාතිකයේ ඉහළ මට්ටම්වලට හේතු වූ සාධක දක්වා පැහැදිලි කරන්න.

iii. 1940 දශකයේ අගභාගයේ දී ශ්‍රී ලංකාවේ දළ මරණ අනුපාතිකයේ පහත වැටීම නිසා ඇති වූ සමාජ - ආර්ථික ප්‍රතිඵල විස්තර කරන්න.